# රසායනික පොහොර වලින් උපරිම ඵල ලබා ගනිමු.

පේරාදෙණිය, ගන්නොරුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ
පර්යේෂණ නිලධාරී **ජේ.එම්.පී.බී. ජයසුන්දර** විසින්

### හැඳින්වීම

ශාක වල වර්ධනයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ අතුරින් ෆොස්ෆරස්, පොටෑසියම්, මැග්නීසියම්, යකඩ, මැන්ගනීස්, තුත්තනාගම්, තඹ, මොලිබ්ඩිනම්, බෝරොන්, ක්ලෝරින් ආදී මූල ද්‍රව්‍ය පස මගින් ද, හයිඩ්‍රජන් හා ඔක්සිජන් ජලය මගින් ද, කාබන් වාතයෙන් ද සපයා ගැනේ. පොහොර නොයොදා නොකඩවාම බෝග වගා කිරීමේ දී පස මගින් සැපයෙන පෝෂ්‍ය පදාර්ථ ක්‍රමයෙන් අඩු වේ. එම නිසා පසට බාහිරව පෝෂ්‍ය පදාර්ථ එකතු කොට මුල් මගින් අවශෝෂණය වීමට සලසනු ලැබේ. සමහර අවස්ථා වල දී පත්‍ර මගින් ද අවශෝෂණය වීමට සලස්වනු ලැබේ. එසේ පෝෂ්‍ය පදාර්ථ එකතු කිරීම පොහොර යෙදීම යනුවෙන් හැඳින්වේ. පසට කාබනික (ඓන්ද්‍රිය) මෙන්ම අකාබනික (අනේන්ද්‍රිය) පොහොර ද එකතු කෙරේ

මෑත කාලයේ දී පොහොර යෙදීම සඳහා අධික වියදමක් දැරීමට සිදු වී ඇති බැවින් කෘෂි ද්‍රව්‍ය වල නිෂ්පාදන වියදම ඉහළ ගොස් බෝග නිෂ්පාදනයේ ලාභාංශය පහළ වැටී ඇත. පොහොර ආනයනය කිරීම සඳහා ජාතික ධනය විශාල ලෙස වැයවේ. අන්තර් ජාතික මට්ටමින් පොහොර මිල සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින අතර, රජය මගින් විශාල වියදමක් දරා සහන මිලට ගොවීන්ට පොහොර සැපයීමට කටයුතු කරනු ලැබේ. සහන මිල වුව ද ගොවීන්ට දරා ගැනීම අපහසු වන තත්වයක් වර්තමානයේ උදා වී ඇත. මේ නිසා යොදනු ලබන පොහොර වලින් උපරිම අස්වැන්නක් ලබා ගත හැකි වන පරිදි ක්‍රමානුකූලව පොහොර භාවිතා කළ යුතුය. අධික හා අනිසි පොහොර භාවිතය හේතු කොට ගෙන ජලය, පස හා වාතය දූෂණය වේ.

ගොවීන් විසින් භාවිතා කරනු ලබන පොහොර ඝන තත්වයේ පවතී. ඒවා ශාක වලට අවශෝෂණය වීමට පෙර විවිධ වෙනස්වීම් රාශියකට භාජනය වේ. එසේ සිදුවන අතරතුර සැලකිය යුතු ප්‍රමාණයක් වාතයට නිදහස් වීම (නයිට්‍රජනීය පොහොර), සේදී යෑම, කාන්දු වීම, ඔක්සිකරණය වීම, පසට තදින් සවි වීම ආදී ක්‍රම මගින් ශාක වලට අහිමි වේ. විවිධ සාධක රාශියක් මගින් පසට එකතු කරනු ලබන පොහොර වල කාර්යක්ෂමතාවය තීරණය කරනු ලැබේ.

මහා පරිමාන වාණිජ මට්ටමේ ගොවිතැනේ දී වැඩි අස්වැන්නක් හා ප්‍රසන්න පෙනුමක් අපේක්ෂා කරමින් ගොවීහු අධික ලෙස පොහොර භාවිතා කරති. මෙමගින් ෆොස්ෆරස් හා පොටෑසියම් යම් යම් ප්‍රමාණ වලින් පස තුළ තැන්පත් විය හැකි අතර පසේ සරු බව අඩු වී පරිසරයට හා ක්ෂුද්‍ර ජීවීන්ට ද හානිදායක විය හැකිය. නයිට්‍රජන් අඩංගු පොහොර සේදී ගොස් ජලාශ වල නයිට්‍රේට් ප්‍රමාණය අධික වී ජලජ ශාක වැඩි වීමත්, නයිට්‍රජන් අධික ජලය පානය කිරීම නිසා මනුෂ්‍යයින්ට විෂ වීමත් (නිල් දරුවන් බිහිවීම, වකුගඩු ආබාධ සෑදීම ආදී) සිදු වේ.

යොදනු ලබන පොහොර වලින් උපරිම ඵල ලබා ගැනීමට නම් වගා කරනු ලබන පස පිළිබඳව මනා දැනුමක් ලබාගත යුතු වේ. ඕනෑම පසක් ඕනෑම බෝගයක් වගා කිරීමට සුදුසුය යන නිගමනයට බැසගතහොත් ඉතාමත් අසීරු තත්වයකට පත්විය හැකිය. එසේම විවිධ බෝග වර්ග විවිධාකාරයෙන් පොහොර වලට ප්‍රතිචාරය දක්වන බැවින් ඒ ඒ බෝගයට යෙදිය යුතු පොහොර වර්ග හා ප්‍රමාණ වෙනස් විය හැකිය. පොහොර අඩුවීමෙන් ද, පොහොර වැඩි වීමෙන් ද ශාක රෝග වලට පාත්‍ර විය හැකිය. කෘමි උවදුරු වලට භාජනය විය හැකිය. ගොයම් දුඹුරු පුල්ලි රෝගය, පොටෑසියම් අඩු වූ විට වැඩියෙන් පැතිරේ. ගොයම් කොළ පාළු රෝගය, බැක්ටීරියා කොළ අංගමාරය ආදී රෝග නයිට්‍රජන් පොහොර වැඩි වූ විට සීඝ්‍රයෙන් පැතිරේ. නයිට්‍රජන් අධිකව යෙදීමෙන් කීඩෑ උවදුරු, කුඩිත්තන්ගේ උවදුරු ආදිය සීඝ්‍රයෙන් පැතිරේ. මේ අනුව පොහොර යෙදීම සංකීර්ණ වූ හා අවබෝධයකින් යුතුව කළ යුතු කාර්යයක් වේ.

බෝග මනාව වර්ධනය වීම සඳහා ශාක පෝෂක මූල ද්‍රව්‍ය 17 ක් පමණ අවශ්‍ය වේ. ඒවා අතරින් කාබන් වාතයෙන් ද, හයිඩ්‍රජන් හා ඔක්සිජන් ජලය මගින් ද ලැබේ. නයිට්‍රජන් , ෆොස්ෆරස් හා පොටෑසියම් යන මහා පෝෂක තුන අප විසින් යොදනු ලබන පොහොර වලින් බහුලව ලබා ගනී. ඒවා විශාල

ප්‍රමාණ වලින් අවශ්‍ය බැවින් මහා පෝෂක යනුවෙන් හැඳින් වේ. ඒවා ස්වභාවිකව පස තුළ යම් ප්‍රමාණ වලින් අඩංගු වී ඇති බැවින් ඒ හරහා ද ශාක වලට ලබා ගත හැකිය. එසේ වුවත් උසස් අස්වැනු ලබාගැනීම සඳහා ඒවා ආගන්තුකව යෙදීමට සිදු වේ.

කැල්සියම්, මැග්නීසියම් හා සල්ෆර් (ගෙන්දගම්) බෝග වලට අවශ්‍ය ද්විතීය පෝෂක වේ. මහා පෝෂක (N.P.K) තුනෙන් නිසි ඵල ලබා ගැනීම සඳහා ද්විතියික පෝෂක ද අවශ්‍ය ප්‍රමාණ වලින් ශාක වලට ලබා ගත හැකි වන පරිදි පස තුළ අන්තර්ගත විය යුතුය. දිගින් දිගටම එකම කෙෂ්ත්‍රයේ බෝග වගා කිරීමෙන් පස හරහා ස්වභාවිකව බෝග වලට සැපයෙන ද්විතියික පෝෂක ප්‍රමාණය අඩු වේ. එවැනි අවස්ථා වලදී ඒවා ප්‍රතිපූරණය නොකළ හොත් බෝග අස්වැනු කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීමට ඉඩ තිබේ. වසර 3 කට පමණ වරක් ගොඩ ඉඩම් වලට ඩොලමයිට්, අළුහුණු හා කිසරයිට් ආදී පොහොර වර්ග යොදනුයේ එවැනි ඌණතා මගහරවා ගැනීම සඳහාය.

ද්විතියික පෝෂක වලට අමතරව කෂුද්‍ර පෝෂක ද ශාක වල සෞඛ්‍ය සම්පන්න වර්ධනය සඳහාත් වැඩි අස්වැනු සඳහාත් වැදගත් වේ. ඒවා නම් අයන් (යකඩ), මැන්ගනීස්, සින්ක් (තුත්තනාගම්), කොපර් (තඹ),මොලිබ්ඩිනම්, බෝරෝන් හා ක්ලෝරීන් වේ. මේවා ස්වභාවයෙන්ම පසෙහි අඩංගු වී ඇතත්, සමහර අවස්ථා වල දී ඌණතා ඇති විය හැකිය. ද්විතියික පෝෂක හා ක්ෂුද්‍ර පෝෂක වශයෙන් ඒවා නම් කොට ඇත්තේ ශාක වලට සුළු ප්‍රමාණ වලින් අවශ්‍ය වන බැවිනි. අවශ්‍ය ප්‍රමාණය සුළු වුවත් ඒවා ශාක වලට ඉතා වැදගත් වේ. උදාහරණයක් මගින් දක්වතොත්, කුඩා බෙහෙත් හෝ විටමින් පෙත්තක් මගින් විශාල මනුෂ්‍යයෙකුගේ රෝග සුව වන්නාක් මෙනි. ද්විතියික හා අංශු මාත්‍ර මූල ද්‍රව්‍ය ඌණතාවයන් ශාකවල පත්‍ර හා ඵල ආදිය විකෘති වීම (උදාහරණය : පැපොල් ගෙඩි වල ගැටිති හට ගැනීම), රෝග වලට පාත්‍ර වීම ආදී ලක්ෂණ මගින් පෙන්නුම් කෙරේ. එම ලක්ෂණ හරහා ඌණ වී ඇති පෝෂකය දැනගැනීම සඳහා සෑහෙන පලපුරුද්දක් අවශ්‍ය වේ. මෙවැනි අවස්ථා වලදී කෘෂිකර්ම කෙෂ්ත්‍රයේ නිලධාරීන් ගේ සහයෝගය ලබා ගැනීම සුදුසුය.

ජෛවීන්ද්‍රිය පොහොර භාවිතා කිරීමෙන් බොහෝ ද්විතියික හා කෂුද්‍ර පෝෂක ඌණතාවයන් මගහරවා ගත හැකි වේ. ශාක පත්‍ර මගින් අවශෝෂණය වන පරිදි යොදනු ලබන දියර පොහොර වර්ග මගින් ද එවන් පෝෂක ඌණතා මගහරවා ගත හැකි වේ. දියර පොහොර තෝරා ගැනීම ඉතා සුපරීක්ෂාකාරීව සිදු කළ යුත්තකි. ඒවා අනවශ්‍ය ලෙස භාවිතා කිරීම මුදල් අපතේ යැවීමක් වේ. එහෙත් වැඩි වටිනාකමකින් යුතු මල් හා විසිතුරු පැළ හා විදේශීය එළවළු වර්ග වගා කරන්නන් විසින් ඒවා බහුලව භාවිතා කරනු ලැබේ.

එකම බෝගය එකම කෙෂ්ත්‍රයේ කන්න කිහිපයක් පුරා වගා නොකළ යුතුය. ඒ ඒ බෝග වලට විශේෂයෙන් අවශ්‍ය වන කෂුද්‍ර පෝෂක ආදිය එසේ කිරීමෙන් ඉක්මනින් ක්ෂය වී යා හැක. බෝගයට සුවිශේෂ වූ රෝග හා කෘමි උවදුරු පැතිර යා හැකිය. එම නිසා කන්නයක් පාසා ශස්‍ය මාරු කිරීමෙන් හා වසර කිහිපයකට වරක් පූරං කිරීමෙන් පස පුනරුත්ථාපනය වීමට ඉඩ සැලසීම, ජෛවීන්ද්‍රිය පොහොර භාවිතා කිරීම හා රෝග හා පලිබෝධ පිටු දැකීම යහපත් ගොවිතැන් රටාවකට අත්‍යාවශ්‍ය බව අවධාරණය කළ යුතුය.

## වර්ෂාවේ බලපෑම

වර්ෂාධික කාලගුණය සහිත අවස්ථා වල දී බෝග වලට ඝන පොහොර යෙදීමෙන් ඒවායේ කාර්යක්ෂමතාවය අඩු වේ. පස මතුපිටින් පොහොර සේදී යෑම, මුල් වලට අවශෝෂණය කරගත නොහැකි තරම් ගැඹුරකට පොහොර සම්රණය වීම ආදිය එයට හේතු වේ. එනිසා රසායනික පොහොර යෙදීමේ දී රට උචිත පරිදි පසේ තත්වය පිළිබඳව ද, බෝග ස්ථාපනය කළ යුතු අවස්ථාව පිළිබඳව ද, පොහොර යොදන අවස්ථාවේ කාලගුණය පිළිබඳව ද මැනවින් අවධානය යොමු කොට කටයුතු කළ යුතුය. තෙත් කලාපයේ කුඹුරු නිතර ජලයෙන් යට වී පවතින නිසාත්, ඒවා වර්ෂාධික ප්‍රදේශ වල පිහිටා ඇති නිසාත්, හෙම්හිට දියවෙන කැට පොහොර වර්ග යෙදීමට සිදු වේ.

පසේ තෙතමනය පොහොර යෙදීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි. පසෙහි තෙතමනය අඩු වූ විට ද, වැඩි වූ විට ද පොහොර වල කාර්යක්ෂමතාවය අඩු වේ. මේ නිසා පොහොර යෙදීමට ප්‍රථම පසේ තෙතමනය ප්‍රශස්ථ මට්ටමක තිබීම ඉතා වැදගත් වේ.

## උෂ්ණත්වයේ බලපෑම

උෂ්ණ කාලගුණයක් පවතින අවස්ථා වල දී හා දවසේ උෂ්ණත්වය වැඩි අවස්ථා වල දී පොහොර යෙදීමෙන් ඒවායේ කාර්යක්ෂමතාවය අඩු වේ. එවැනි අවස්ථා වල දී විශේෂයෙන් නයිට්‍රජන් පොහොර වලින් නයිට්‍රජන් අඩංගු වායු වර්ග පිටවී පැළෑටි වලට අවශෝෂණය වන පොහොර ප්‍රමාණය අඩු වීම ඊට ප්‍රධාන හේතුව වේ. ප්‍රශස්ථ මට්ටමකට ජලය සැපයීමෙන් උෂ්ණත්වය පාලනය කරගත හැකි වන අතර නයිට්‍රජන් වායු පිටවී යෑම ද අඩු කර ගත හැකි වේ. යොදනු ලබන පොහොර

වගී පස මතුපිටින් යොදනවාට වඩා පසට කළවම් කිරීමෙන් කාර්යක්ෂමතාවය වැඩි කර ගත හැකිය. එසේ කිරීමෙන් සේදී යෑම, වියෝජනය, වාෂ්පීකරණය ආදී ක්‍රම මගින් වන හානිය අඩු කර ගත හැකිය. පාංශු කොලොයිඩය සමග පොහොර වගී සම්බන්ධ වී සේදී යෑමෙන් වැළකේ. ඓන්ද්‍රිය පොහොර යෙදීමෙන් ඓන්ද්‍රිය කොලොයිඩය සමග ද පොහොර වගී සම්බන්ධ වී වඩාත් මැනවින් ආරක්ෂා වේ. පාංශු උෂ්ණත්වය පාලනය වේ. පසට පොහොර කළවම් කිරීමේ දී වගා කරනු ලබන බෝගයේ මුල මණ්ඩලය විහිදී ඇති සීමාව නොඉක්මවා යෙදීමට කටයුතු කළ යුතුය. උෂ්ණාධික රටවල් වල දී ආගන්තුකව යොදනු ලබන රසායනික නයිට්‍රජන් පොහොර වලින් වැඩි කොටසක් දින 1 - 1 1/2 කට වැඩි කාලයක් පසේ රඳා නොසිටී. සේදී යෑම, ක්ෂීරණය වීම, වියෝජනය, වාෂ්පීකරණය, ශාක වලට අවශෝෂණය වීම ආදී කරුණු හේතු කොට ගෙන ඒවා ඉතා ඉක්මණින් නැති වී යයි. රසායනික නයිට්‍රජන් පොහොර බෝග වලට කිහිප අවස්ථාවකදී යොදනුයේ මේ නිසාය.

## පාංශු භෞතික තත්වයේ බලපෑම

වැලි සහිත පසක ප්‍රශස්ථව මැටි අඩංගු වී ඇති පසක මෙන් පොහොර දරා සිටීමේ හැකියාව නැත. වැලි පසක පොහොර කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීම සඳහා ඒවායේ වගා කරනු ලබන බෝග වලට එක් වරකට නිර්දේශ කර ඇති පොහොර ප්‍රමාණය කිහිප වරකට බෙදා යෙදිය යුතුය. වැලි පසට මැටි පස් හා ඓන්ද්‍රිය ද්‍රව්‍ය එකතු කිරීමෙන් ද කාර්යක්ෂමතාවය වැඩි කර ගත හැකිය. පසේ මැටි අධික නම් ජලය රැඳී තිබීමේ හැකියාව වැඩි වන බැවින් කාණු හා පාත්ති ආදිය සකසා ජලය බැස යාමට සැලැස්විය යුතුය. මැටි පස ජලය නොමැති අවස්ථා වලදී තද වේ. එම නිසා මැටි පසේ බෝග වගා කරන අවස්ථාවේ දී බෝග මුල් අවට ප්‍රදේශය බුරුලෙන් පවතින පරිදි සී සා හෝ කොටා බුරුල් කොට කාබනික ද්‍රව්‍ය හා වැලි පස් ආදිය මිශ්‍ර කිරීම උචිතය.

ඉඩමක් ජලය බැස යන අතට බෑවු ්‍යකල එහි උඩාවතේ කොටස ස්වභාවයෙන්ම යටාවතේ කොටසට වඩා සාරවත් භාවයෙන් අඩු වේ. එබැවින් විවිධ බෝග සඳහා නිර්දේශිත පොහොර යෙදීමේ දී මුළු ක්ෂේත්‍රය පුරා සමව නොවිසුරුවා, උඩ කොටසට වැඩියෙනුත්, පහළ කොටසට තරමක් අඩුවෙනුත් පොහොර යෙදීම සුදුසුබව පෙනේ. මෙය කළ යුත්තේ ක්ෂේත්‍රය පුරා පසේ සාරවත් භාවය පිළිබඳව ගොවීන් විසින් වටහා ගත් පසුය. පානබොක්කේ ගුරින් විසින් විග්‍රහ කොට ඇති ගොඩ කුඹුර, මැද කුඹුර හා මඩ කුඹුර යන තත්වයන් හි දී මෙය සුවිශේෂ වේ. සමතල ක්ෂේත්‍රයක දී මෙවැනි ගැටළු උද්ගත වනුයේ ඉතා සුළු වශයෙනි.

## පාංශු රසායනික තත්වයේ බලපෑම

පසේ රසායනික තත්වය යොදනු ලබන පොහොරවල කාර්යක්ෂමතාවයට බලපාන්නේය. පස ප්‍රශස්ත රසායනික මට්ටමක පවතින විට පමණක් යොදනු ලබන රසායනික පොහොර වලින් නිසි ඵල ලබා ගත හැකිය. රසායනික තත්ව අතුරින් පාංශු පී.එච්. අගය ප්‍රධාන තැනක් ගනී. පසේ පී.එච්. අගය 4 - 9 අතර වේ. පී.එච්.අගය 7 ක් ලෙස තිබීමේදී පස උදාසීන නොහොත් මධ්‍යස්ථ තත්වයක පවතී. පී.එච්. අගය ඊට වඩා අඩු වෙත්ම පස ආම්ලික වන අතර, 7 ට වඩා වැඩි වෙත්ම භාෂ්මික වේ. අධික ලෙස ආම්ලික වූ පසෙහි බෝග වගා කිරීමෙන් සාර්ථක අස්වැනු ලබාගත නොහැකි වේ. පී.එච් අගය 5 - 8 අතර පවතින විට බෝග වර්ධනය සඳහා අවශ්‍ය පෝෂක පසෙන් උරා ගැනීමට හැකි වේ. පසේ ආම්ලික තත්වය අඩු කරගැනීම සඳහා වසර 2 කට පමණ වරක් හෙක්ටයාරයකට අළු හුණු කි.ග්‍රෑ.700. හෝ ඩොලමයිට් කි.ග්‍රෑ. 1000 ක් පමණ පොහොර යෙදීමට සති 2 - 3 කට පෙර යෙදිය හැකිය. එසේ කිරීමෙන් රසායනික පොහොර වල කාර්යක්ෂමතාවය වැඩි වනු ඇත. එහෙත් කිසි විටෙකත් අළු හුණු හෝ ඩොලමයිට් සමග එකවිට රසායනික පොහොර නොයෙදිය යුතුය.

## කාබනික ද්‍රව්‍ය වල බලපෑම

පසෙහි අඩංගු කාබනික ද්‍රව්‍ය මගින් ශාක වලට අවශ්‍ය පෝෂක රඳවා ගැනීමේ හැකියාව වැඩි කෙරේ. මැටි කලිල වලට වඩා ඓන්ද්‍රිය කලිල වල ඍන අරෝපනය බෙහෙවින් වැඩි බැවින් ඓන්ද්‍රිය කලිල වල ශාක පෝෂක රඳවා තබා ගැනීමේ හැකියාව වැඩිය. ඓන්ද්‍රිය ද්‍රව්‍ය මගින් රසායනික පොහොර වලින් ලබාගත් පෝෂක වැඩි කාලසීමාවක් තුළ දී ශාකයට සපයනු ලබයි. මේ නිසා රසායනික පොහොර වල කාර්යක්ෂමතාවය වැඩි වේ. දිගු කාලීනව සත්ව වසුරු, කොම්පෝස්ට්, බෝග ශේෂ, කොළ අතු ආදී ඓන්ද්‍රිය ද්‍රව්‍ය පසට යෙදීමෙන් කන්නයක් පාසා පසට එකතු කළ යුතු රසායනික පොහොර ප්‍රමාණය අඩු කර ගත හැකි වනු ඇත. රසායනික පොහොර වලට පසේ වයනය හා ව්‍යුහය, පී.එච්. අගය ආදී ගුණාංග දියුණු කළ නොහැකි වන අතර, ඓන්ද්‍රිය ද්‍රව්‍ය යෙදීම නිසා ඒවා එන්ට එන්ටම දියුණු වේ. බෝග සරු කිරීමට හා ආරක්ෂා කර ගැනීමට උපකාරී වන පණුවන් ක්ෂුද්‍ර ජීවීන් ආදීන් ගේ ගහනය වැඩි වේ. නයිට්‍රජන් තිර කරන ක්ෂුද්‍ර ජීවීන් වැඩි වේ. ක්ෂුද්‍ර ජීවීන් බෝග ආරක්ෂා කරන රසායනික ද්‍රව්‍ය පිට කරන බව දැන් සොයාගෙන ඇත. පසක පණුවන්

හා ක්ෂුද්‍ර ජීවීන් අධික නම් එය එම පසේ සාරවත් බවට සාක්ෂියක් වේ. ක්ෂුද්‍ර ජීවීන් හා පණුවන් ජීවත් කරවීම සඳහා උන්ගේ ආහාරය වන ජෛවීන්ද්‍රිය ද්‍රව්‍ය පසට එකතු කළ යුතුමය. ජෛවීන්ද්‍රිය ද්‍රව්‍ය නිසා පාංශු තෙතමනය ආරක්ෂා වේ. ජෛවීන්ද්‍රිය පොහොර ද රසායනික පොහොර හා සමානව පස සමග මිශ්‍ර කොට යට කර දැමිය යුතුය.

පොහොර යෙදීමේ නිර්දේශ කෙසේ වුවත් ගොවීන්ට පොහොර යෙදිය හැක්කේ අතේ මිටේ මුදල් තිබේනම් පමණි. එම නිසා තමා අත තිබෙන මුදලට සරිලන සේ කාර්යක්ෂමව හා සමබරව පොහොර යෙදීම සඳහා යෙදිය යුතු බිම් ප්‍රමාණය, යෙදිය යුතු පොහොර වර්ග හා ඒවායේ ප්‍රමාණ, වගා කරනු ලබන බෝගයේ පොහොර අවශ්‍යතාවය , යෙදිය යුතු කාල සීමාව ආදී කරුණු රාශියක් පිළිබඳව කල්පනා කළ යුතුය. මෙවැනි තීරණ ගැනීම සඳහා ගොවීන්ට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන් ගෙන් උපදෙස් ලබාගත හැකි වේ.

ජෛවීන්ද්‍රිය පොහොර භාවිතා කිරීමේදී බෝග වලට නිර්දේශ කොට ඇති සම්පූර්ණ රසායනික පොහොර ප්‍රමාණයම යෙදීම අනවශ්‍ය වේ. පිදුරු ටොන් 2 ක් පමණ අක්කරයක කුඹුරකට යෙදීමෙන් රසායනික පොහොර ලෙස ගොයමට යෙදිය යුතු පොටෑසියම් මුළු ප්‍රමාණයත්, යූරියා කි.ග්‍රෑ. 25 - 27 ක් පමණත් ඉතුරු කර ගත හැකි වේ. වගා කරන ලද බෝගයේ අස්වැන්න කොටස පමණක් ගෙදර ගෙනගොස් බෝග ශේෂ කෙත තුළ යට කර දැමීමෙන් හෝ අඩු වශයෙන් විසුරුවා හැරීමෙන් පස සාරවත් කරගත හැකි වේ. පසේ අඩංගු වී ඇති පොහොර ප්‍රමාණය පස් පරීක්ෂා කරවා ගැනීමෙන් දැන ගත හැකි වනු ඇත. ඒ අනුව ද ක්ෂේත්‍රයට දිය යුතු පොහොර ප්‍රමාණ අඩු වැඩි කර ගත හැකිය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පස් පරීක්ෂණාගාර මගින් ගොවීන්ට තම ක්ෂේත්‍රවල පස් පරීක්ෂා කරවා ගත හැකි වේ. මේ පිළිබඳ වැඩි විස්තර කෘෂිකර්ම උපදේශක වරුන් වෙතින් දැනගත හැකි වනු ඇත.

වෙළඳ පොළෙන් විවිධ පොහොර මිශ්‍රණ මිල දී ගන්නවාට වඩා පස් පරීක්ෂා කරවා ගැනීමෙන් අනතුරුව සෘජු (අමිශ්‍ර) පොහොර තමාගේ ක්ෂේත්‍රයට අවශ්‍ය ප්‍රමාණ වලින් මිල දී ගැනීම වාසි දායක වේ.

වෙළඳ පොළේ ත්‍රිත්ව සුපර් ෆොස්ෆේට් වලට රොක් (පාෂාණ, ගල්) ෆොස්ෆේට් කලවම් කොට ඇති අවස්ථා ද, පොටෑසියම් වලට ඩොලමයිට් කලවම් කොට ඇති අවස්ථා ද හෙළි වී ඇත. මේවා පිළිබඳව දැන ගැනීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ සහාය ලබා ගත හැකි වේ. මෙසේ බාල කරන ලද පොහොර වල කාර්යක්ෂමතාවය අඩු වේ. රොක් ෆොස්ෆේට් දියවීම සඳහා දීර්ඝ කාලයක් ගත වේ. එම නිසා මාස 3 - 4 රේ කෙටි කාලීන බෝග වලට ඒවා අවශෝෂණය කර ගැනීමේ අවස්ථාව නොලැබී යයි. රොක් ෆොස්ෆේට් සුදුසු වනුයේ තේ, රබර්, පොල්, කෝපි ආදී බහු වාර්ෂික බෝග සඳහාය. පොහොර මිලට ගැනීමේදී මේ පිළිබඳව සුපරීක්ෂාකාරී වී විශ්වාසය තැබිය හැකි ආයතන වලින් පිළිගත් වෙළඳ ලතුණු සහිත පොහොර වර්ග මිලට ගත යුතුය.

වෙළඳ පොළෙහි ඇති ඕනෑම පොහොර මිශ්‍රණයක් ඔබේ වගාව සඳහා නොගැලපෙන බව විශේෂයෙන් මතක තබා ගත යුතුය. පොහොර මිශ්‍රණ සකසා ඇත්තේ විවිධ බෝග වල පොහොර අවශ්‍යතා සැලකිල්ලට ගෙනය. එම නිසා වගා කරනු ලබන බෝගයට ගැලපෙන පොහොර මිශ්‍රණය තෝරා ගත යුතු වේ. පස් පරීක්ෂා කර ගැනීමේදී පස තුළ ෆොස්ෆේට් හෝ පොටෑසියම් හෝ ඒ දෙකම සැලකිය යුතු ප්‍රමාණ වලින් පසේ අඩංගු වී තිබේ නම්, ආගන්තුකව යෙදීමට අවශ්‍ය වන ෆොස්ෆේට් හා පොටෑසියම් ප්‍රමාණය අඩු කර ගත හැකිය. ජෛවීන්ද්‍රිය ද්‍රව්‍ය යෙදීමෙන් ප්‍රධාන පොහොර තුන් වර්ගයේම ආගන්තුකව යෙදිය යුතු ප්‍රමාණය අඩු කරගත හැකි වේ. ඒ අනුව බලන කල පස් පරීක්ෂා කරවා ගැනීමෙන් හා ජෛවීන්ද්‍රිය ද්‍රව්‍ය යෙදීමෙන් අනතුරුව අඩුපාඩු වන පෝෂක පමණක් සෘජු (අමිශ්‍ර) පොහොර වශයෙන් යෙදීම ඉතා වාසිදායක වේ.

කල් ඉකුත් වූ, ඝන වූ හා දියවී කැට ගැසුණු පොහොර මිලට ගැනීමෙන් වළකින්න. වාණිජ ලෝකය විෂමය. මෑතක දී යූරියා පොහොර වල බයියුරේට් නමැති ශාක වලට විෂ සහිත වූ ද්‍රව්‍යයක් අඩංගු වී තිබූ බව හෙළි විය. බයියුරේට් අඩංගු යූරියා පොහොර යෙදූ ගොයම් කහ වී වර්ධනය බාල විය. මෙවැනි අවස්ථා පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සෙවිල්ලෙන් සිටින අතර, ඒවා පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම අපගේ යුතුකම හා වගකීම වේ.

අමිශ්‍ර පොහොර ලෙස වෙළඳ පොළෙන් යූරියා, ඇමෝනියම් සල්ෆේට්, මියුරියේට් ඔෆ් පොටෑෂ්, ත්‍රිත්ව සුපර් ෆොස්ෆේට්, රොක් ෆොස්ෆේට් ආදී පොහොර වර්ග මිලට ගත හැකිය. මේ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොහොර නිර්දේශ අනුගමනය කොට කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිලධාරීන් ගේ මග පෙන්වීම අනුව පොහොර යෙදීම සුදුසුය.